ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි සිව්වන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය –2017 ජූලි/අගෝස්තු

ආර්ථික විද්‍යාව

**ECON 4122.03 – ව්‍යාපෘති කළමනාකරණය**

කාලය : පැය තුනයි (03)

---

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

(අ) ව්‍යාපෘතියක් අනෙකුත් කාර්යයන්ගෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) ව්‍යාපෘති ජීවන චක්‍රය (Project Life Cycle) එහි එක් එක් අදියර කෙරෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ) කාර්යයන් බිඳීමේ ව්‍යුහය (Work Breakdown Structure) යනු කුමක්ද? කිසියම් ව්‍යාපෘතියකට අදාලව එවැනි ව්‍යුහයක් ගොඩනගා ගැනීමට භාවිතා කල හැකි ක්‍රම තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඈ) අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල් සපයා ගැනීමේ අරමුණින් ABC නම් රාජ්‍ය නොවන සංවිධානය විශ්වවිද්‍යාල සිසුන් අතර ධාවන තරඟයක් පැවැත්වීමට කටයුතු කරමින් සිටියි. ඔබ මෙම රාජ්‍ය නොවන සංවිධානයේ ව්‍යාපෘති කළමනාකරු ලෙස උපකල්පනය කරමින් මෙම ව්‍යාපෘතියට අදාල කාර්ය බිඳීමේ ව්‍යුහය (Work Breakdown Structure) සකස් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

**ප්‍රශ්න අංක 02**

(අ) "ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර එහි ශක්‍යතාවය අධ්‍යයනය නොකිරීම ව්‍යාපෘති අසාර්ථක වීමට හේතු වේ." ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනයේ විවිධ පැතිකඩයන් ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) මූල්‍ය විශ්ලේෂණය සහ ප්‍රතිලාභ පිරිවැය විශ්ලේෂණය (Financial Analysis and Cost Benefit Analysis) අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ) ව්‍යාපෘති විශ්ලේෂණයේදී පවතින වෙළඳපොළ මිල භාවිතා කල නොහැකි අවස්ථාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ) රු. 50,000 සමාන ආයෝජනයක් අවශ්‍යවන ව්‍යාපෘති දෙකක් පිළිබඳව ABC සමාගම අධ්‍යයනය කරමින් සිටියි. මෙම ව්‍යාපෘති දෙකෙහි ව්‍යාපෘති කාලය තුළදී ජනනය වන ආදායම් ප්‍රවාහයන් පහත වගුවේ දී ඇත.

| වර්ෂය | අපේක්ෂිත ආදායම | |
|---|---|---|
| | A ව්‍යාපෘතිය | B ව්‍යාපෘතිය |
| 1 | 25,000 | 10,000 |
| 2 | 15,000 | 12,000 |
| 3 | 10,000 | 18,000 |
| 4 | -- | 25,000 |
| 5 | 12,000 | 8,000 |
| 6 | 16,000 | 4,000 |

මෙහි A ව්‍යාපෘතිය රාජ්‍ය අංශයට සම්බන්ධ ව්‍යාපෘතියක් වන අතර ඒ සඳහා 10% විශේෂ පොලී අනුපාතයක් යටතේ අරමුදල් සැපයීමට රාජ්‍ය බැංකුවක් ඉදිරිපත් වී සිටියි. එමෙන්ම B ව්‍යාපෘතිය වාණිජ ව්‍යාපෘතියක් වන අතර ඒ සඳහා අරමුදල් සපයා ගත හැක්කේ 15% පොලී අනුපාතයක් යටතේය.

ඔබ ABC සමාගමේ ව්‍යාපෘති කළමනාකරු ලෙස උපකල්පනය කරමින් A සහ B ව්‍යාපෘති දෙක අතුරින් කුමන ව්‍යාපෘතිය තෝරා ගත යුතුද යන්න පිළිබඳව විශ්ලේෂණය කරන්න. ව්‍යාපෘතියට අදාල මූලික ආයෝජන ව්‍යාපෘතිය ආරම්භයේදී සිදු කල යුතු බවට උපකල්පනය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක 03

(අ) ජාල සටහන් විශ්ලේෂණයට අදාල අවධි මාර්ග ක්‍රමය සහ ව්‍යාපෘති ඇගයීම් සහ විශ්ලේෂණ ශිල්ප ක්‍රමය අතර වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ආ) ව්‍යාපෘති කඩිනම් කිරීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 03)

(ඇ) කපිල පරිගණක මෘදුකාංග නිෂ්පාදන සමාගම එක් ගණුදෙනුකරුවෙකු සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් සඳහා යෝජනාවලියක් සකස් කොට ඇත. එම ව්‍යාපෘතිය සඳහා සමාගමේ ව්‍යාපෘති කළමනාකරු පහත උපලේඛනය (3.1) සකස් කොට ඇත .

උපලේඛනය (3.1)

| කාර්යය | ආසන්නතම කාර්යය | සර්ව සුභවාදී කාලය | මධ්‍යස්ථ කාලය | සර්ව අසුභවාදී කාලය |
|---|---|---|---|---|
| A | නැත | 2 | 3 | 4 |
| B | නැත | 3 | 4 | 5 |
| C | නැත | 4 | 5 | 6 |
| D | B | 1 | 2 | 3 |
| E | B, C | 1 | 0.5 | 3 |
| F | B | 3 | 4 | 5 |
| G | A, D | 5 | 6 | 7 |
| H | A, D, E, F | 2 | 3 | 4 |
| I | B, C | 1 | 2 | 3 |
| J | G, H | 2 | 3 | 4 |
| K | I, J | 3 | 6 | 9 |
| L | G, H | 4 | 5 | 6 |
| M | I, J | 3 | 4 | 5 |
| N | L, K | 1 | 2 | 3 |

(අ) ව්‍යාපෘති ජාල සටහන නිර්මාණය කරන්න. **(ලකුණු 05 යි)**

(ආ) අවධි මාර්ගය හඳුනා ගන්න. **(ලකුණු 03 යි)**

(ඇ) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය සොයන්න. **(ලකුණු 02 යි)**

(ඈ) කාර්ය E සහ H සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමේ කාලයට බලපෑමක් නොමැතිව ප්‍රමාද කල හැකිද? **(ලකුණු 02 යි)**

(ඉ) කාර්යවලට අදාල මුළු ශිථිල කාලය සහ නිදහස් ශිථිල කාලය ගණනය කරන්න. **(ලකුණු 02 යි)**

(ඊ) ව්‍යාපෘතිය දින 28 කින් නිම කිරීමේ සම්භාවිතාවය ගණනය කරන්න. **(ලකුණු 04 යි)**

**(මුළු ලකුණු 25)**

## <u>ප්‍රශ්න අංක 04</u>

ඔබ ග්‍රාම සංවර්ධන නිළධාරිවරයකු ලෙස සේවය කරන්නේ යැයි සිතන්න. ග්‍රාමයේ සිදු කරමින් පවතින මාර්ග සංවර්ධන ව්‍යාපෘතියකට අදාලව පහත සංකල්ප පැහැදිලි කරන්න. ඔබගේ පැහැදිලි කිරීම් තුල එහි නිර්වචනයන්, භාවිතයන් සහ දී ඇති සංකල්පය ව්‍යාපෘතියට අදාල වන ආකාරය අන්තර්ගත කල යුතුය.

(අ) ව්‍යාපෘති ප්‍රඥප්තිය (Project Charter)

(ආ) සහභාගීත්ව සැලසුම්කරනය (Participatory Planning)

(ඇ) වැඩ කට්ටලය (Work Package)

(ඈ) රඳා පැවතීම් (Dependencies)

(ඉ) ඡායා මිල (Shadow Price)

**(ලකුණු 5 බැගින්)**

**(මුළු ලකුණු 25)**

************